පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# තල් සංවර්ධන මණ්ඩලය

# පුරප්පාඩු

**තල් සංවර්ධන මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. කළමනාකාර (මූල්‍ය) MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍යය / මූල්‍ය / ව්‍යාපාර පරිපාලන විශේෂ මූලික උපාධියක් සහ පිළිගත් වෘත්තීමය ගිණුම්කරණ මණ්ඩලයක අන්තර්මධ්‍ය සුදුසුකමක් ලබා තිබීම.
2. වෘත්තීය ගිණුම්කරණ මණ්ඩලයක ආශ්‍රිත සාමාජිකත්වය (ICASL, CIMA U.K, ACCA සහ CMA හෝ ඊට සමාන).
3. ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලයෙන් හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙන් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ පිළිගත් වෘත්තීය ගිණුම්කරණ මණ්ඩලයක අන්තර්මධ්‍ය සුදුසුකම ලබා තිබීම.

සහ

4. සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / පිළිගත් වෙළෙඳ ආයතනයක විධායක කළමනාකාරිත්ව මට්ටමේ ගිණුම්කරණ / විගණන ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නො අඩු පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කණිෂ්ඨ කළමනාකරු (JM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :

වයස අවුරුදු 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩ ඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය

MM 1-1 – 2016 රු. [53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575]

## 2. අභ්‍යන්තර විගණක තනතුර MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම් :**

**බාහිර :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් රාජ්‍ය කළමනාකරණ/ මූල්‍ය ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ / කෘෂිකර්මය / විද්‍යාව / නීතිය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර :**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කණිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :

වයස අවුරුදු 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩ ඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය

MM 1-1 – 2016 රු. [53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575]

## 3. කණිෂ්ඨ කළමනාකරු තනතුර JM 1-1

**සුදුසුකම් :**

### ප්‍රාදේශීය සම්බන්ධීකාරක (තනතුරු 02)

**බාහිර :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් රාජ්‍ය කළමනාකරණ / මූල්‍ය ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ / කෘෂිකර්මය / ජීව විද්‍යාව / නීතිය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම සහ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර :**

"කළමනාකරණ සහකාර" කාණ්ඩයේ 1 ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් විය යුතු ය.

### විගණන නිලධාරී (තනතුරු 02)

**බාහිර :**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙන් [ICASL] කළමනාකරණ හෝ වාණිජ්‍යය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම හෝ වරලත් කළමනාකාරණ ගණකාධිකරණ [CIMA] ආයතනයෙන් අන්තර්මධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම හෝ වරලත් සහතික ලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනයෙන් අන්තර්මධ්‍ය මට්ටමේ සුදුසුකම් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලොමාව සහ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගාත් වෙළෙඳ ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : පරිගණකගත ගිණුම්කරණ පරිසරයක් වෙත නිරාවරණ

**අභ්‍යන්තර :**

"කළමනාකරණ සහකාර" කාණ්ඩයේ 1 ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් විය යුතු ය.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩ ඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය

JM 1-1-2016: රු.[42,600 -10 x 755 – 18 x 1,135 – 70,580]

## 4. කළමනාකරණ සහකාර තනතුර (තාක්ෂණික) MA 2 - 1 (තනතුරු 10)

1. කළමනාකරණ සහකාර
2. පොත් තබන්නා
3. සංවර්ධන සහකාර
4. නිෂ්පාදන සහකාර

**සුදුසුකම් :**

**අධ්‍යාපන :**

අ) විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ්‍යය සහිතව එක් වරකදී අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් පහත විෂයන් 3 ඇතුළත්ව විෂයයන් හයක් සමත් වීම

I සිංහල / දෙමළ

II ගණිතය

ඉ) අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් "පොදු ප්‍රශ්න පත්‍රය" හැර තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය විෂයයන් ගණන සමත් වී අවශ්‍ය සාර්ය සාධනය ලබා තිබීම.

**වෘත්තීය :**

පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙන් N.V.Q. 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර :**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවක කාණ්ඩයේ - පුහුණු, ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු සේවකයන් හට අයදුම් කළ හැකි ය.

අ) පහත විෂයන් තුන ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ්‍යය සහිතව එක් වරකදී අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වීම

III සිංහල / දෙමළ

IV ගණිතය

ආ) පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් N.V.Q. 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

ඇ) ඉහත සේවක කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** :

වයස අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩ ඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය

MA 2-1: රු. [30,310 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 – 50,940]

## 5. පර්යේෂණ නිලධාරී තනතුර AR - 1 (තනතුරු 01)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර හතරක (4) විශේෂ උපාධියක් පළමු හෝ ඉහළ දෙවන පෙළ පංතියක් සහිතව ලබා තිබීම (රසායන විද්‍යාව, ආහාර විද්‍යාව සහ තාක්ෂණය, ආහාර සහ පෝෂණය, ජෛවතාක්ෂණය, ජෛව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව).
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාමාන්‍ය උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම (රසායන විද්‍යාව, ආහාර විද්‍යාව සහ තාක්ෂණය, ආහාර සහ පෝෂණය, ජෛවතාක්ෂණය, ජෛව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව).
3. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.
2. "මෙහෙයුම් / උපදෙස්" (MA 4) හෝ "බලාත්මක / මෙහෙයුම් / ව්‍යාප්ති" (MA 5) කාණ්ඩයේ අධ්‍යයන / පර්යේෂණ ක්‍රියාකාරකම්වලට අදාළ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වයස** :

වයස අවුරුදු 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය, කාර්යක්ෂමතා කඩ ඉම සහ රැකියා ව්‍යුහය**

සේවක කාණ්ඩයේ මාසික වැටුප් පරිමාණය සහ වැටුප් කේතය

AR 1 – 2016 රු. (53,150 – 10 x 1,375 – 15 x 1,910 – 95,550)

## පොදු :

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරු යහපත් ශාරීරික සහ මානසික තත්ත්වයකින් හෙබි විය යුතුය.
3. අයදුම්කරු ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

අයදුම්කරුවන් තම අත්සන යෙදූ අයදුම්පත්‍ර, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, වෙනත් අදාළ සහතික යනාදියේ පිටපත් සහ සාක්ෂාත්කර දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීවරයාගෙන් ලබාගත යුතුය) සහිතව ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක සහිතව **සභාපති, තල් සංවර්ධන මණ්ඩලය, අංක. 498, ගාලු පාර, කොළඹ 06** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.02.10 වේ.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තම අයදුම්පත්‍ර ඔවුන්ගේ ප්‍රධානීන් මගින් එවිය යුතු ය. පිටපතක් සෘජුවම එවිය යුතු ය.

කරුණාකර අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කරන්න.

අදාළ සහතිකවල පිටපත් රහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

තනතුර ලබාගැනීමට බලපෑම් කිරීම **නුසුදුසු** වීමට හේතුවක් වෙනු ඇත